ස්වයං අධ්‍යයනයට අත්වැලක්

- ශ්‍රේණිය - 11
- වාරය - 3
- නිපුණතා මට්ටම - 2- 6 නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර සහසම්බන්ධතාව විමසුමට ලක්කරයි.
- ක්‍රියායාරකම - චිත්‍ර /සංගීත / නාට්‍ය / නර්තන / කලා හඳුනා ගනිමු.






- සැකසුම - කෝශලි කරුණාතිලක,
  මප/වත්/මහවැලි ම.වි., කටුගස්තොට
- මෙහෙයවීම - නර්තන අංශය ,
  කලාප අධ්‍යාපන කාර්යාලය , වත්තේගම

උපදෙස්

මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

- හැඳින්වීම.


මේවන විට අප විවිධ ශ්‍රේණිවලදී දේශීය නර්තන සම්ප්‍රදායන්ගේ තොරතුරු මෙන්ම ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ තොරතුරු අධ්‍යයනයකර ඇත.

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ, නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර ඇති සහසම්බන්ධතාවය හඳුනා ගැනීම.

එසේම කලා කෘතියක් නිර්මාණයේ දී කලා මාධ්‍යයන්ගේ අනන්‍යතාවයන් හඳුනා ගැනීම, නර්තන කලාව හා අනෙකුත් කලාවන් සම්බන්ධවන අයුරු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ද අපගේ බලාපොරොත්තුවයි.

කලාංගයක් යනු,

සෞන්දර්යාත්මක වින්දනයක් උත්පාදනය කරමින් උසස් රසවින්දනයක් පුද්ගලයන් වෙත ගෙන එන්නා වූ මාධ්‍යය කලාව ලෙස සරලව අර්ථ ගැන්විය හැක. සාම්ප්‍රදායිකව කලාව යන වචනය යොදා ගන්නේ කිසියම් හැකියාවක් හෝ නිපුණතාවයක් දැන්වීම සඳහාය.









කලාංගයන්ගේ මාධ්‍යය

නර්තනය	රිද්මය මත පදනම් වූ අංග චලන
චිත්‍ර කලාව	රිද්මය මත පදනම් වූ රේඛා , හැඩතල හා වර්ණ
සංගීත කලාව	රිද්මය මත පදනම් වූ ශබ්දය හා නාදය.
නාට්‍ය කලාව	සතර අභිනය යොදා ගනිමින් යමක් කර දැක්වීම





නර්තන කලාව හා සබැඳි චිත්‍ර කලාව ,

චිත්‍ර කලාවේ පදනම ලෙස වර්ණ ,රේඛා ,හැඩ, හැඩතල,අවකාශය හා ආකෘතියයි. චිත්‍රයක් නිර්මාණයේ දී විවිධ ශිල්පක්‍රම යොදා ගනී. නර්තනයේ මූලික මාධ්‍ය රිද්මය මත පදනම් වූ මානව අංග චලනයි.ඉන් අවකාශයේ ගොඩ නැගෙන රූප පෙළ ගැස්ම නර්තනයයි. චලනයෙන්ම පමණක්ම නර්තනය පරිපූර්ණ නොවේ. නර්තනය , චලන යොදා ගනිමින් විවිධ රේඛා ඔස්සේ යමින් , චලන හසුරුවමින්, අංගහාර ගොඩ නඟමින් විචිත්‍ර කළ හැක.

එවැනි නර්තනයකට ජීවය ලබා දෙනුයේ ගායන, වාදනය, අංග රචනය, රංග වස්ත්‍රාභරණ හා සැරසිලි ආදියෙනි.

- චිත්‍ර කලාවේ දී රේඛා, හැඩ ,හැඩතල වර්ණ යොදා ගනිමින් සිතුවමක් නිර්මාණය කරයි. එහි දී රිද්මය නිශ්චිතව පවතී.නර්තනයේ දී ද රිද්මය පවතී.චිත්‍ර සංරචනයේ දී අවකාශයේ රේඛා මවන්නා සේ මානව චලන මත හැඩ තල මවයි.
- නර්තනයේ දී මෙන්ම චිත්‍ර කලාවේ දී අවකාශ භාවිතය අත්‍යාවශ්‍ය සාධකයකි.

- චිත්‍ර කලාවේ ඇති ඇඹීම, නෙළීම , වර්ණ ගැන්වීම, යන ක්‍රමවේදයන් නර්තන කලාවේ ඇති ශාන්තිකර්ම ආශ්‍රිත සැරසිලි, බලි ඇඹීමේ දී ආදියේ දී යොදා ගනී,

- නර්තන අංගයක ප්‍රාසාංගික ගුණය රඳවා ගැනීම සඳහා රංග වස්ත්‍රාභරණ යොදා ගත යුතුය.එහිදී හැඩතල ,වර්ණ, උචිත පරිදි යොදා ගැනීමෙන් අලංකාරය තීව්‍ර වේ. එය ද චිත කලාවේ ශිල්ප ක්‍රමයයි.

බලි ඇඹීම, වර්ණ ගැන්වීම





ශාන්තිකර්ම ආශ්‍රිත සැරසැලි





රංග වසුත්‍රාභරණ





නර්තන කලාව හා සබැඳි සංගීත කලාව

සංගීතය යනු යම්කිසි ස්වර පරාසයක් තුළ ගායනය, වාදනය , සිදුකර අසන්නා හට චින්දනයක් ලබා දෙන කලා මාධ්‍යයකි.එහි සීමාව සප්ත ස්වරයයි.

උඩරට ,පහතරට,හා සබරගමු වශයෙන් ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රධායන් ත්‍රිත්වයහි අනුතර්ගතය ගොඩනැගී ඇත්තේ ඒ ඒ සම්ප්‍රදායන්ට ආවේණික වූ ශාන්තිකර්ම මූලිකකර ගනිමින්ය.

උඩරට නර්තන සම්ප්‍රදායේ කොහොඹා යක් කංකාරිය, පහතරට නර්තන සම්ප්‍රදායේ දෙවොල් මඩුව, සබරගමු නර්තන සම්ප්‍රදායේ පහන් මඩුව ශාන්ති කර්මය වශයෙන් මේ සෑම ශාන්තිකර්මයකම නර්තන, ගායන, වාදන , යන ප්‍රධාන කොටස් වලින් පෝෂණය වී ඇත.

ඒ අනුව සෑම ශාන්තිකර්මයකම නර්තන, ගායන, වාදන, අතර ඇති අන්තර් සම්බන්ධතාවය මොනවට පැහැදිළිය.

- ලාංකේය නර්තන සම්ප්‍රදායේ වාද්‍ය භාණ්ඩය බෙරයි බෙර හඬෙහි මතු වන්නා වූ තරංගවල හඬට වඩා උස් හඬකින් ගායනය හැසිරවීම සිදු වේ.





මෙහි දැක්වෙන්නේ සාම්ප්‍රදායික නර්තන සඳහා ගායන, වාදන, යොදා ගන්නා ආකාරයයි.

නූතන වේදිකාවේ ජනමාධ්‍ය විෂයෙහි රූපවාහිණිය හා සබැඳි විවිධාංගකරණයේ දී නර්තන කලාවේ පෝෂණයට සංගීතය නවාංගයක් ලෙෂ එකතු වී ඇත.එහි දී දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩ මෙන්ම ඉන්දියාන්, බටහිර වාද්‍ය භාණ්ඩ ද සංයෝජනයකර වාදනය මඟින් නර්තන අංගයන්ට විචිත්‍රත්වයක් එක්කර ඇත. බෙර වාදනය සමඟින් සිදු කරනු ලබන නර්තන අංගයන් හා සංගීතය සුසංයෝග වූ නර්තන අංගයන් අතර පැහැදිළි වෙනසක් , ආකර්ෂනීයත්වයක් , විචිත්‍රත්වයක් ශ්‍රවණ මාධුර්යයක් ඇත. එකී වෙනසට හේතු වූයේ ම සංගීත කලාවෙන් ලැබුණු පෝෂණයයි.





❖ දේශීය ඉඟි නළු, ගීත නාට්‍ය, බැලේ, යන කලා කෘතීන්ගේ ගමන් මාර්ගය සංගීතයයි.මුළුමනින් ම මෙම නාට්‍ය ගලා යනුයේ සංගීතය පදනම් කරගෙනය.







නර්තන කලාව හා සබැඳි නාට්‍ය කලාව.

නාට්‍ය ප්‍රභේදනයේ දී විවිධ නාට්‍ය වර්ග බිහි ව ඇත.නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ගෙන යාමේ දී රඟ දක්වනු ලබන ශෛලීන් නොහොත් ඒවායේ ආකෘති අතර දක්නට ලැබෙන වෙනස්කම් මුල් කොට ගනිමින් රංග ප්‍රධාන ශෛලීන් දෙකක් පිළිබඳව භරත මුනිවරයා සඳහන්කර ඇත.

- නර්තනයේ දී චලනය මත පදනම් ව යමක් කර දක්වන අතර , නාට්‍යයේදී නර්තනය මෙන්ම රඟ දැක්වීමක් ද දැක ගත හැක.
- කතාව, දෙබස්, සංවාද , නර්තන, ගායන, වාදන, ඇතුළත් නාට්‍යමය අවස්ථා දේශිය ශාන්තිකර්ම තුළ අන්තර්ගත වී ඇත. (අඹ විදමන, යක්කම්, ගුරුගෙ මාලාව, ...)
- දේශිය ශාන්තිකර්ම තුළ නාට්‍යමය අවස්ථා ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ ප්‍රේක්ෂකයා ඒකාකාරී බවින් මුදවා ගැනමයි.
- රිද්ම රටා, හැඩතල, සම්බන්ධතා,අවකාශ භාවිතය,දිසා හා තල භාවිතය වැනි සාධක නර්තනයේ මෙන්ම නාට්‍ය තුළ ද දැක ගත හැක.



දෙවොල් ගොඩබැසීම



නොංචි කෝළම



ගුරුගෙ මාලාව



සොකරි

නර්තනය , චිත්‍ර , සංගීත , නාට්‍ය යන කලාංගවල ඇති සන්නිවේදන ලක්ෂණ

සන්නිවේදනය යනු අදහස් හුවමාරුකර ගැනීම යන සරල අර්ථය ගෙන දේ. කලාවන් යනු යම් කිසි අදහසක් ජනිත කරවන්නකි. කලාකරුවා සිදුකරනුයේ යම් අදහසක් සමාජය වෙත සම්ප්‍රේෂණය කිරීමයි. මෙසේ සමාජය වෙත අදහස් රැගෙන යන කලාංග කිහිපයක් අපි දැනටමත් හඳුනාගෙන ඇත්තෙමු.

නර්තනය,

- මෙය ප්‍රාසාංගික කලාවකි. නර්තනය සතුට දනවයි. එදිනෙදා සමාජයේ ප්‍රීතිමත් අවස්ථාවල දී නර්තනයේ යෙදීම අපි අත්විඳ ඇත්තෙමු.
- දේශීය නර්තන සම්ප්‍රදායන් පදනම් වී ඇත්තේ ශාන්තිකර්ම මතය. එහිදී නර්තන ශිල්පියා ආතුරයින්හට අංග චලන මඟින් සෙත් පතයි. එය අදහස් හුවමාරුකර ගැනීමකි.
- වර්තමානයේ ගීතයේ අදහස ප්‍රකාශ කිරීම සඳහා ජනප්‍රිය මාධ්‍යයක් ලෙස යොදා ගන්නේ නර්තනයයි.ගීතයෙන් කියවෙන අදහස වඩාත් නිවැකර දැක්වීම මින් සිදු වේ.
- දේශීය ඉඟිනළු නිර්මාණයේ දී මෙන්ම බටහිර බැලේ නර්තනයේ දී කථා පුවතම ඉදිරිපත් කරනුයේ අංග චලන හෙවත් නර්තන මාධ්‍යයෙනි.අංග චලනයන්ගේ ස්වභාවය අනුව නරඹන්නා නිර්මාණ කරුවාගේ අදහස වටහා ගනී.

උදාහරණ,



ගජගා වන්නමේ දී ඇතෙකුගේ චලන යොදා ගැනීම



ගොයම් කැපීම නර්තනය මඟින් ප්‍රකාශ කිරීම

චිත්‍ර,

ඈත අතීතයේ සිටම මිනිසා තම අදහස් ප්‍රකාශන මාධ්‍යයක් ලෙස සිතුවම් කලාව යොදා ගත් බවට අප්‍රමාණ සාධක ඇත.

ප්‍රාග් ඓතිහාසික යුගයේ මානව ක්‍රියාකාරකම් පිළිබඳව අදහසක් ලබා ගැනීම සඳහා අල්ටාමීරා වැනි ගුහා චිත්‍ර වරතමානයේ දී ද යොදා ගන්නේ එබැවිනි.ඒ බව අප නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේ දී අධ්‍යයනය කළෙමු. සිතුවම් තුළින් පහත අදහස් ප්‍රකාශ වේ.

- ආගමික විශ්වාස (පන්සල් ,පල්ලි,කෝවිල් බිතුසිතුවම්,)
- අත්දැකීම් (ආදරය, වියෝව, කාලගුණික විපර්යාස.....)
- සොබා සෞන්දර්යය (ගංගා,ඇළ, දොළ,.....)
- සමාජීය ක්‍රියාකරාකම් හා වෘත්තීන් (කර්මාන්ත, ගොවිතැන.....)
- මානව හා සත්තව රූප
- ඓතිහාසික තොරතුරු

උදාහරණ

- මෑත කාලයේ මාර්ග දෙපස ඇති තාප්ප බොහෝ පිරිස් එක් වී සිතුවම් කළ ආකාරය මබට මතක ඇත. ඒවායින් බොහෝමයක් ප්‍රකාශන චිත්‍රය. ඒවායේ අන්තර්ගතය දුටුවන් හට ශ්‍රී ලංකාව පිළිබඳ අභිමානයක් ඇති කිරීමට තරම් ප්‍රභලය.





- නර්තනය සම්බන්ධ තොරතුරු ලබාගත හැකි සිතුවම්.




සංගීතය

ගීතය ,සංගීතය යනු ශ්‍රව්‍ය කලාවකි.වචන හා සංගීත සංයෝජන තුළින් නිර්මාණකරුවා අසන්නාට පණිවිඩයක් ලබා දෙයි.ඒ අතර

- ජන ගායනා
  - ❖ වෘත්තීන් සම්බන්ධ හා කෙළි සම්බන්ධ

- ගීත
  - ❖ මව් ගුණ, පිය ගුණ, ගී
  - ❖ දේශාභිමාන ගී
  - ❖ විරහ ගී
  - ❖ සමාජීය සිදුවීම්
  - ❖ බැති ගී



- සංගීත සංඩිවනි

උදාහරණ

1.අතීතයේ පැල් කවි ගායනා සිදු කළ ආකාරයට සිහියට නගා ගන්න.එම ගායනය තුළින් පැල් රකින්නාගේ පාළුව, නිදිමත, සිතේ ඇතිවන හැඟීම් ප්‍රකාශ කළා මෙන්ම අනිත් පැල් රකින්නන් සමඟ අදහස් ප්‍රකාශනයක් ද සිදු විය.

2. "මාතර ගඟේ සිටිනා ..." මෙම පාරු කවියෙන් කියවෙන්නේ කිඹුලෙක් පිළිබඳව නොවන අතර අසාධාරණකමින් පීවත් වූ තොටුපළ හිමියෙකු පිළිබඳවයි.මින් පෙනී යන්නේ ව්‍යාංගාර්ථයෙන් පවා අදහස් ප්‍රකාශ කිරීමට සංගීතයට හැකියාව ඇති බවයි.

3. ඔබගේ පාසැල් ගීතය මතකයට නගා ගන්න. එම ගීතය ගායනයේදී ඔබට පාසැල පිළිබඳ අභිමානයක් මෙන්ම එහි පිහිටීම, ආදිය පිළිබඳව කියවෙන බව මතකද?

4.ඇසළ සමයේ .මහනුවර නගරයේ නිතර ඇසෙන සංගීත සංඩිවනිය ඔබට මතකද? ඇසළ පෙරහැර සමය ආරම්භ බව අපට මතක් කරන්නේ පෙරහැරටම ආවේණික වූ එම වාදනයෙනි

නාට්‍ය

ඔබ මීට පෙර 10 ශ්‍රේණියේ දී නාට්‍ය ප්‍රභේද පිළිබඳ මනා අවබෝධයක් මේ වන විට ලබාගෙන ඇත. නාට්‍යයක් මඟින් බොහෝ කරුණු පිළිබඳව සන්නිවේදනයක් සිදු කළ හැකි බව එහි දී ඔබට අදහසක් ලබා දී ඇත.

- ❖ **ගීත, සංගීතය**
- ❖ **දෙබස්**
- ❖ **රංග උපකරණ, පසුතල නිර්මාණ,රංග වස්ත්‍රාභරණ, ආලෝකකරණය**
- ❖ **අංග චලන**
- ❖ **භාව ප්‍රකාශන**

යන සියළුම අදහස් ප්‍රකාශන මාධ්‍ය යොදා ගත හැක.

නාට්‍ය මඟින් ද

- **ආගමික විශ්වාස**
- **අත්දැකීම්**
- **සමාජීය ක්‍රියාකරාකම්**
- **ඓතිහාසික තොරතුරු**
- **ව්‍යසන**

යන මේවා පිළිබඳව සන්නිවේදනයක් ලබා දිය හැක.

උදාහරණ



කැළණි පාළම නම් මෙම නාට්‍යයෙන් කියවෙන්නේ ගංවතුර සමයේ පාළම අසල වෙසෙන්නන් මුහුණ දෙන ගැටළු සම්බන්ධව සන්නිවේදනයකි



කුඹි කථාව නම් මෙම කථාවේ මෙම දර්ශනයෙන් පෙන්වන්නේ සාදයක අවස්ථාවකි.

නර්තනය , චිත්‍ර , සංගීත , නාට්‍ය යන කලාංගවල ඇති තුලානාත්මක ලක්ෂණ

